**ආලයාඩිවේම්බු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආලයාඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන්ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වටිනාකම රු.4,950,000 ක් වන වාහන 11 ක අයිතිය සභාවට පවරා දී තිබුණත්, එම වාහනවල වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2015 සහ 2016 වර්ෂවලදී රු. 187,570කට විකුණා තිබූ ගොඩනැගිලි උපකරණවල මුහුණත අගය අදාල ගිණුම්වලින් ඉවත් නොකර ඉහත විකුණුම් මිල ඉඩම් හා ගොඩනැගිලිවල පිරිවැයෙන් ඉවත් කර තිබුණි.

#### 1.3.2 අයවිය යුතු මුදල්

1991 වර්ෂයේ සිට හිඟහිටව පැවැති මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.65,070 ක ණය ශේෂය ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

#### 1.3.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ | - | මූල්‍ය හා ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම් සහ සමාජ සංවර්ධන, තාක්ෂණික සේවා, පරිසර හා පොදු උපයෝගිතා සේවා යනාදී කර්තව්‍යයන් |

| | | | |
|---|---|---|---|
| | පළාත් පාලන, නිවාස සහ ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උපවගන්ති ප්‍රකාර | | සඳහා වෙනම කණ්ඩායම් ස්ථාපිත නොකර සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය සංවර්ධන කමිටු රැස්වීම් 06ක් පමණක් පවත්වා තිබුණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ සභාවේ සංවර්ධන සැලසුම් ඉදිරියට ගෙනයාමට ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් සංවර්ධන වැඩසටහන් 17කින් සංවර්ධන වැඩසටහන් 02ක් පමණක් නිම කර තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | - | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වල අත්සන් කිරීම වැනි කටයුතු නිලධාරීන් තිදෙනෙකුට රාජකාරීමය වශයෙන් පවරා තිබුණද, එම නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 මුදල් රෙගුලාසිය | 549,198 | තැන්පතු 09 ක් වර්ෂ දෙකක් ඉක්ම වූ ඉකුත් තැන්පතු වශයෙන් දක්නට ලැබුණත් සභාව විසින් අදාල පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | 12,996,980 | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලබන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස්ජනරාල්වරයාට යැවිය යුතුය. එසේ වුවද, 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ගෙවනු ලැබූ එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එලෙස දැනුම් දී නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,874,997 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,079,193 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,795,804 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම, රැස් කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 250,000 | 722,161 | 722,161 | - | - | 218,370 | 255,064 | - |
| කුලී | 1,990,000 | 2,072,874 | 2,137,874 | 541,318 | 1,950,000 | 1,924,907 | 1,867,607 | 606,319 |
| බලපත්‍ර ගාස්තු | 805,000 | 671,877 | 671,877 | 16,680 | 925,000 | 514,064 | 514,064 | 16,680 |
| වෙනත් ආදායම් | 13,381,000 | 11,803,112 | 11,803,112 | - | 11,441,000 | 10,577,564 | 10,577,564 | - |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකර ගතයුතු ආදායම් රු. 15,893,023 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 15,335,024 ක් අයකරගෙන තිබුණි. මේ අනුව, ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 96% ක් වශයෙන් දක්නට ලැබුණි.

## 2.2.3 වරිපනම් හා බදු

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ව්‍යාපාරික ආයතන 577 කින් සහ නිවාස 7,851 කින් වරිපනම් තක්සේරු කර අයකිරීමට කටයුතු කරනු ලබන බව දැනුම් දී තබුණත්,මෙම වරිපනම් හා බදු අයකිරීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් රු.4,000,000 ක ආදායම් අහිමිව තිබුණි

2.2.4 **කුලී අයකිරීම**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **මස් කඩ බදු දීම**

**---------------**

1988 සිට 2013 කාල පරිච්ඡේදය තුළ අයකර ගතයුතු මස්කඩ හිඟ බදු රු.501,318 ක් වර්ෂ 04 කට අධික කාලයක් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ව්‍යාපාර බදු**

**-------------**

2017 දෙසැම්බර් 31 දිනට පැවැති ව්‍යාපාර බදු හිඟ මුදල් රු.16,680 ක ශේෂය වර්ෂ 09 කට අධික කාලයක සිට අයකර ගැනීමට හෝ නිසි අයුරින් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **පොදු වෙළඳපොල වාහන නැවතුම් පොළ බදු දීම**

**-----------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපොල ආසන්නයේ පැවැති වාහන නැවතුම්පොළ සඳහා හිඟ කුලී රු.53,716 ක් වර්ෂ 07ක සිට අයකර ගෙන නොතිබුණි.

(ඈ) **පොදු වෙළඳපොල කඩ කාමර කුලී ආදායම්**

**------------------------------------------**

පොදු වෙළඳපොලේ කඩ කාමර NECORD සැලැස්මේ මූල්‍යාධාර යටතේ රු.9,200,000ක වටිනාකමට ඉදිකර 2009 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණි.එසේ වුවත්, මෙම කඩ කාමර සංකීර්ණයේ පැවති කඩකාමර 16 න් කඩ කාමර 10 ක් ඉදිකරනු ලැබූ දින සිට මේ දක්වා කිසිදු අරමුණක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද, වර්තමානයේ පවතින කුලී වටිනාකම් පිළිබඳ සැලකිල්ල යොමු නොකර 2009 වර්ෂයේදී කුලියට දෙනු ලැබූ රු.1,500 ක් සහ රු.2,500 ක වටිනාකමටම මේ දක්වා කුලියට ලබා දී තිබූ බැවින් සභාව වාර්ෂිකව රු.240,000 ක ආදායමක් අහිමි කරමින් පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කාර්යාලවලින් ලැබී තිබුණු සභාව විසින් භාවිතා කරනු ලබන, වාහන 12 ක අයිතිය වර්ෂ තුනකට අධික කාලයක සිට මාරු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව ජනවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 8.81 සිට රු.මිලියන 19.6 ක පරාසයක ප්‍රමාණයකින් අත ඉතිරි මුදල් පැවැති බව නිරීක්ෂණය විය. මෙම මුදල් ස්ථාවර තැන්පතු ගිණුම්වල හෝ ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර පොලී ආදායම් ඉපැයීමට කටයුතු කළ හැකිව තිබුණත්, ඒ සඳහා වූ පියවර සභාව විසින් නොගැනීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.1,000,000 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ අහිමි වී තිබුණි.

(ඇ) සභාව සතුව අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පැවැති කැබ් රථයක්, ගල් රෝලක් සහ ට්‍රේලර් 04 ක් අලුත්වැඩියා කර භාවිතා නොකර වර්ෂ තුනකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

### 3.2 පුස්තකාල ක්‍රියාකාරකම්

ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන එනු ලබන ආලෙයිඅඩිවේම්බු මහජන පුස්තකාලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල අයවැය සැලැස්මට අනුව මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම වෙනුවෙන් රු. 300,000ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ රු 16,120ක් වටිනා පොත් පමණක් මිලදී ගෙන තිබුණි. තවද, පුස්තකාල ක්‍රියාකාරකම් වෙනුවෙන් වගකිව යුතු ප්‍රජා මධ්‍යස්ථාන සංවර්ධන නිලධාරී හා පුස්තකාලයාධිපති විසින් සභාවෙන් නව නිර්දේශයන්ට අනුව පොත්පත් ඉල්ලීම් කර තිබුණත්, 2018 මාර්තු 22 දින වන විටත් මිලදී ගෙන ලබාදී නොතිබුණි.

(ආ) සභාව විසින් ස්ථාපිත කරනු ලැබූ පුස්තකාල සංවර්ධන කමිටුව වර්ෂ දෙකකට අධික කාලයක සිට ක්‍රියාත්මක නොවීමෙන් පුස්තකාලයේ දියුණුවත් පාඨකයින්ගේ පුස්තකාල භාවිතයත් මන්දගාමීව පැවතුණි.මේ සම්බන්ධයෙන් සභාවේ වගකිව යුතු නිලධාරීන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.3 අයිතිය මාරු කරනු නොලැබූ වත්කම්

සභා ගොඩනැගිල්ල, පුස්තකාලය, සංස්කෘතික මණ්ඩපය, පොදු වෙළෙඳපොල ගොඩනැගිල්ල, ක්‍රීඩා පිටි, ප්‍රජා මධ්‍යස්ථාන ගොඩනැගිලි සහ සුසාන භූමි ඇතුළත් වත්කම් 14ක් සභාව ආරම්භ කළ 1988 වර්ෂයේ සිට මේ දක්වා සභාවේ අයිතියට පවරා ගෙන නොමැති රජයේ ඉඩම් වශයෙන් දක්නට ලැබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

#### 3.4.1 කිරුබෙයි රාජා ආසිරියර් මාර්ගයේ කානු ඉදිකිරීම

සභාව විසින් 2016 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, පාලක පාලන ආයතනවල මූලධන සංවර්ධන වැඩසටහන් යටතේ කිරුබෙයිරාජා ආසිරියර් මාර්ගයේ මීටර් 450 ක් දිග කාණු ඉදිකිරීම සඳහා රු.3,481,668 ක වටිනාකමට කොන්ත්‍රාත්වලට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුම් ප්‍රකාරව සඳහන් කොන්ත්‍රාත් කාර්යයන් 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රථම නිම කළ යුතුව තිබුණත්, 2017 පෙබරවාරි 15 දින සම්පූර්ණ කර තිබුණි. එසේ වුවත්, 2016 දෙසැම්බර් 31 දින මෙම කාර්යයන් නිම කළ බවට ලේඛන සකස් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු රු.78,337 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) අදාළ කාණු ඉදිකිරීම් කර්මාන්තය 2016 දෙසැම්බර් 09 දින දිග මීටර් 450 කින් සම්පූර්ණ කර ඇති බවට ලේඛන සකස් කර තිබුණද 2018 මාර්තු 20 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී මීටර් 405.8 ක් දිග කාණු පමණක් නිම කර තිබුණි.

(ඇ) අදාළ කාණු ආසන්න ප්‍රදේශයේ සිටින මහජනතාවගේ ලිඛිත ඉල්ලීම සහ ලේකම්වරයාගේ අනුමැතියෙන් තොරව කාර්මික නිලධාරීගේ අධීක්ෂණය යටතේ කොන්ත්‍රාත්කරු විසින් පුද්ගලික නිවාස කරා පිවිසීම සඳහා කාණුවලට ඉහලින් පාලම් ඉදිකිරීම නිසා ගිවිසුම් අනුව මීටර් 44.2 ක් දිගට කාණු ඉදි නොකළ පවුල් 25 කට අධික සංඛ්‍යාවක් ඉඩම් සහ එයට ආසන්නයේ පවතින ප්‍රදේශවල වැසිවතුර බැස යාමට නොහැකි තත්ත්වයක් උදා වී තිබුණි.

(ඈ) නිම කරන ලද මීටර් 405.8 ක් දිග කානුවලින් ජලය නිසි අයුරින් බැස යා හැකි පරිදි කසල රැඳී පවතින අතර අදාළ කාණු ආසන්නයේ පවතින ප්‍රදේශවල බෝවන රෝග ඇතිවීමේ අවදානමක් ඇති වී තිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කළමනාකරණය

සභාව විසින් 2016 වර්ෂයේ පළාත් සභාවට වෙන් කරනු ලැබූ සංවර්ධන ආධාර යටතේ කන්නගීපුරයේ කසල එක්රැස් කර කාබනික පොහොර පිළියෙල කිරීමේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානයක් රු.1,253,940 ක වියදමින් ඉදිකරනු ලැබ 2017 වර්ෂයේ ප්‍රදේශයේ තරුණයින් විසින් සිදුකළ උද්ඝෝෂණ හේතුවෙන් නවතා දමා තිබුණි. එසේ වුවත්, ජනතාවගේ ඉල්ලීම් පරිදි, වනඅලීන් ගමට ඇතුල්වීම නවතාලීම හෝ කුණු කන්දට විසඳුම් ලබාගැනීම වැනි ඉල්ලීම් 2018 මාර්තු 22 දින දක්වා ඉටු නොකර තිබූ අතර මේ සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයන් හා සැලසුම් ක්‍රියාත්මක කිරීම් සිදුකර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

2016 වර්ෂය සඳහා වන ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මාර්ග 06 කට බොරළු යෙදීම සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර් 07 දින තාක්ෂණික නිලධාරියා සමඟ සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී ලබාගනු ලැබූ මිනුම් අනුව එම මාර්ගවලට බොරළු කියුබ් 436 ක් සහ ක්‍රෙසර් කුඩු කියුබ් 42 ක් වශයෙන් යොදා තිබුණි. එසේ වුවත්, බොරළු කියුබ් 561 කට සහ ක්‍රෙසර් කුඩු කියුබ් 117 කට ගෙවීම් සිදුකර තිබුණි. මේ අනුව රු.610,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගැනීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | දඩ ගාස්තු අයකිරීම |